# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,093 — 1934ක්වූ නොවැම්බර් මස 30 වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 935 (මාතර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1934ක්වූ නොවැම්බර් මස 30වන දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද, රජසන්තක ඉඩමක් වශයෙන් ගෙණ ඊට කටයුතුකරණ බවද, එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙසින් දැනුම්දෙනු ලැබේ.

මේ 1934ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දින මාතර කච්චේරියේදීය.

සී. ජේ. ඩී. ලැන්ක්වූ,
උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු උප ඒජන්තතුමා ගෙන්ද, ඒවායේසිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේ ගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

(c) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරණු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

#### උප ලේඛනය.

දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ ගඟබඩපත්තුවේ වල කඳ යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි ඒනම්:—

උතුරට : කිරින්ද මගින් ඉහල සහ හෙට්ටියාවල යන ගම්වල ගම්ඉමද, (ගෝනවලආරෙදෙල) හෙට්ටියාවල යන ගම ගම් ඉමද කම්බන්තොට දිස්ත්‍රික්කේ මායිමද (හැටමන යන ගම).

නැගෙණහිරට : හම්බන්තොට දිස්ත්‍රික්කේ මායිමද, (හැට මානගම) නො. 225,102 කේ පිඹුරු කඩදසියේ පෙනියන ඉඩමද, ඩබ්ලිව්. ඒ. ලූවිස්හාමි විසින් අයිතිවාසිකම් කියන මිමනගොල ආරෙදෙනියද, ඩබ්ලිව්. ඒ. ලූවිස්හාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන හොරගහ දෙනියද, එච්. ඒ. පී. කරෝලිස්අප්පු සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන පුංචිදෙනියද.

දකුණට ; එච්. ඒ. පී. කරෝලිස්අප්පු සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන අඹගහකොරටුවද, නො. 213,175යේ සහ 213,174රේ පිඹුරු කඩදසියේ පෙනියන ඉඩම්ද, එච්. ඒ. පී. කරෝලිස්අප්පු සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන දෙලේදෙනියද, එච්. ඒ. පී. ජන්දිරිස්හාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන මූකලන්කනත්තේදෙනියද, ආණ්ඩුවට අයිති ගල්පලතන්නද, ඩී. ඒ. ඒ. වික්‍රමසිංහ විසින් අයිතිවාසිකම් කියන හීන්දෙනිය නොහොත් අරත් දෙනියද, වටවල ආරේ දෙලද, වලකන්ද පන්සලේ භාරකාරයින් විසින් අයිතිකම් කියන පිංකුඹුරද, පුහුල්වෙල්ලේ සිට වලකන්දට යන පාරද, ඩී. ඒ. ඒ. වික්‍රමසිංහ විසින් අයිතිකම් කියන ලෙව් දෙනියේ පකලකලද, නො. 168,654රේද, 397,274රේ සහ 242,423යේ පිඹුරුකඩදසිවල පෙනියන ඉඩම්ද, ඇස්. කොතලාවල සහ තවත් අය විසින් අයිතිකම් කියන ගෝන වලදෙලේ දෙනියද.

බස්නාහිරට : කිරිංදමගින්ඉහල යන ගම ගම්ඉමද, ඩී. ඒ. ඒ. වික්‍රමසිංහ විසින් අයිතිකම් කියන ගෝනවලදෙලේ දෙනියද, නො. 250,183යේ පිඹුරුකඩදසියේ පෙනියන ඉඩම්ද, කිරිංදමගින්ඉහල යන ගම් ගම්ඉමද (ගෝනවලආරේදෙල).

කැලෑමැතීමේ මුල් සිතියම් නො. 51.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|
| 11 | ගෝනවලදෙලේදෙනිය .. | .. | 0 | 0 | 5 |
| 12 | එම .. | .. | 0 | 0 | 38 |
| 17 | මහයායේකැලේ .. | .. | 0 | 0 | 38 |
| 19 | පුංචිදෙනියේඅත්මග සහ හොරවිටිවෙලේ දෙනියේඅත්මග .. | .. | 3 | 2 | 36 |
| 20 | අරත්දෙනියේඅත්මග .. | .. | 3 | 0 | 35 |
| 21 | එම .. | .. | 0 | 2 | 2 |
| 24 | මහයායකැලේ .. | .. | 0 | 3 | 38 |
| 26 | එම .. | .. | 0 | 0 | 36 |
| 49 | මාදෙලවත්ත .. | .. | 0 | 0 | 15 |
| 54 | දන්ගහහේන නොහොත් මිල්ලගහහේන | .. | 9 | 2 | 8 |
| 56 | කිරිමැටිවලගාවඑකොඩහේන | .. | 7 | 3 | 38 |
| | මුළු ගනන | .. | 26 | 3 | 9 |

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Kandy No. 244.**—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1935ක්වූ ජනවාරි මස 18වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතහේවාහැට කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මූල් සිතියමේ නො. 8,084. ගම—මාරස්සන. අයිතිකාරයන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 23H | කුඩාබන්ඩාරයාය .. | ඒ. ඇම්. උක්කුබන්ඩා සහ ඒ. බන්ඩාර මැණිකා .. | හේන .. | 2 0 0 |

මෙම ඉඩම් නොම්බර 384 (මහනුවර) දරණ ඉඩම් නිරවුල්කිරීමේ නොතීසිය යවනේ ඝරගත් පොරොන්දු පත්‍රය අනුව රුපියල් 79·25කට ඉල්ලුම්කාරයින්ට තීන්දුකරනු ලැබේ.

මෙම ඉඩම සම්බන්ධ වැඩිදුර කාරණා මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**Kandy No. 245.**—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1935ක්වූ ජනවාරි මස 18වෙනි දිනවූ සිකුරාදා පෙරවරු10.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ යටිනුවර සහ උඩුනුවර කෝරළවල පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

මූල් සිතියමේ නො. 8,698. ගම—හන්තොරුව. අයිතිකාරයන්නා—ආණ්ඩුව සහ ඇස්. පුංචිබන්ඩා, කළුබන්ඩා, කිරිබන්ඩා, උක්කුබන්ඩා, බිසෝමැණිකා සහ රන්මැණිකා.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 67 | සුවදදෙනියේවත්ත ... | — .. | තේ .. | 0 3 33 | 10 |
| 69 | එම .. | — .. | වත්ත .. | 0 2 12 | 10 |
| 70 | සුවදදෙනියේකුඹුර .. | — .. | කුඹුර .. | 0 1 10 | 10 |
| | මූල් සිතියමේ නො. 9,152. ගම—ඊරියගම. අයිතිකාරයන්නා—ආණ්ඩුව (අයිතිය උම්මා අල්ලාගන තිබේ). | | | | |
| 1 | හැවහෙන්වෙල්ල .. | — .. | ගලින් බැද තිබෙන ඉස් තොප්පුව | 0 0 0·20 | 22·29* |
| | මූල් සිතියමේ නො. 9,159. ගම—වහරක්ගොඩ. අයිතිකාරයන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | මාරහෙල .. | — .. | පහත් කැලෑව | 0 3 26 | —† |
| 2 | එම .. | — .. | මුඩුබිම .. | 0 0 5 | —† |
| 3 | මාරහෙල නොහොත් නිකතැන්න | — .. | එම | 0 0 11 | —† |
| 4 | දන්කොරමේ .. | — .. | එම .. | 0 0 1 | —† |
| 5 | මාරහෙල .. | — .. | පහත් කැලෑව | 0 0 5 | —† |

* බිම්කච්චියට † නොවිකුණා ඉතුරුකරනු ලැබේ.

මේ ඉඩම් සම්බන්ධ වැඩිදුර කරුණු මධ්‍යම දිසාවේ ඒජන්ත තුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 28වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 11,249, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1935ක්වූ ජනවාරි මස 17වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ඇල්පිටියේ ගම්සභාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු පලාතේ ගාල්ල දිස්ත්‍රික්කේ බෙන්තොට වලල්ලාවිටිකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මූල් සිතියමේ නො. 598. ගම—පොරවාගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 431F | ගොනහිත්තලකුඹුර .. | පොරවගම පදිංචි මලවිගේ චාර්ලිස් විසින් වැඩිපුර අල්ලාගන තිබෙන බිම | කුඹුර .. | 0 0 16 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරිතුමාගෙන්ද, ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 26වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රත්මලානේ අහස්යාත්‍රා නැවතුම්පලක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 433. ගම—අත්තිඩිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 46 | — .. | නොබැඳපු කානුදෙකක්ද, මේසන් වැඩකරනලද බෝක්කු 3ක් සහ යකඩ ගේට්ටුවකින් යුත් පාර | කේ. ඇම්. ඇන්. ඇස්. පී. නාච්චිඅප්ප චෙට්ටියර්, නො. 247, වැල්ලවීදිය, කොළඹ | 0 2 38·1 |
| 47 | කඳවලවත්ත .. | රබර්ගස් 6,322ක්ද, පොල්ගහක් සහ මාදන්ගහකින් යුත් රබර් ඉඩම | එම .. | 58 1 26·1 |
| 48 | එම .. | රබර්ගස් 7,960ක්ද, පොල්ගස් 4ක්ද, පුවක්ගස් 2ක්ද, දවටගහක්ද, කොස්ගහක්ද, මේසන්වැඩ කරනලද බිත්ති සහ සින්ක්තහඩු වහලකින්යුත් වැසිකිලියක් සහ නොබැඳපු කානු 4කින් යුත් රබර්ඉඩම | එම .. | 74 2 27·7 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නො. | මිනුම, අ. | රූ. | ප. |
| --- | --- | --- | --- | --- | --- | --- |
| 50 | දෙල්ගහවත්ත .. | පොල්ගස් 19ක්ද, පොල්පැල 43ක්ද, කොස්ගස් 6ක්ද, දෙඩම් ගස් 20ක්ද, අඹගස් 4ක්ද, අඹපැල 5ක්ද, දෙඹ ගහක්ද, ගොඩපොරගහක්ද, දෙහිපැල 9ක්ද, කරපිංචා ගහක්ද, ලුනුමිදෙල්ලගහක්ද, කොච්චන් පැලයක්ද, කජුගස් 2ක්ද, ගොරකගහක්ද, බිලින්ගහක්ද, පුවක් ගස් 8ක්ද, ආත්තගස් 3ක්ද, කෙසෙල් පඳුරු 12ක්ද, මේසන්වැඩකරනලද උළුසෙවිලි ගෙයක්ද, මේසන්වැඩ කරනලද උළුසෙවිලි වැසිකිලියක්ද, මේසන්වැඩකරන ලද බැම්මක් සහ සිමෙන්තිවැඩකරනලද ඒප්‍රන් එක කින්යුත් ළිඳක්ද, මේසන්වැඩ කරනලද තාප්පයක් සහ ගේට්ටුකුලුනුවලින්යුත් පොල්ඉඩම | ඒ. ඊ. තිලකරත්න, අත්තිඩිය | 0 | 1 | 35 |
| 51 | කහටගහවත්ත | පොල්ගස් 5ක්ද, පොල්පැල 29ක්ද, දෙහිපැල 2ක්ද, අඹපැලයක්ද, දෙල්ගහක්ද, කජුගහක්ද, කෙසෙල් පඳුරු 6ක්ද, ළිඳක් සහ අතුසෙවිලි මැටි ගේපැලකින් යුත් පොල්ඉඩම | දොන කැරලිසින් ලේකම් වසම් සහ ඒ. ඊ. තිලකරත්න (සම්මුතිව), දෙදෙනාම අත්තිඩිය | 0 | 2 | 3·9 |
| 52 | එම .. | එලවළු වගාවක්ද, රබර්පැල 107ක්ද, පොල්පැල 10ක්ද, මාදන්ගහක්ද, අඹගහක්ද, අඹපැලයක්ද, දෙහිගහක්ද, දෙඩම්ගහක්ද, කජුගස් 2ක් සහ කෙසෙල් පඳුරු 3කින් යුත් ඉඩම | හෙට්ටිකන්කානන්ගේ ජේම්ස් පේ‍්‍රරා, අත්තිඩිය | 0 | 2 | 19·7 |
| 53 | එම .. | රබර්පැල 70ක්ද, කජුපැල 16ක්ද, ගොරකගස් 2ක්ද, දවටගස් 2ක්ද, අඹපැලයක්ද, පොල්ගහක් සහ ළිඳකින් යුත් කුරුඳුඉඩම | එම .. | 0 | 2 | 16 |
| 54 | එම .. | පොල්ගස් 24ක්ද, රබර්පැල 92ක්ද, කොස්ගහක්ද, කජුගස් 5ක්ද, ගොඩපොර පැලයක්ද, මඞීත්තගස් 2ක් සහ දෙවටපාරක කොටසකින්යුත් පොල්ඉඩම | එම .. | 0 | 1 | 25·7 |
| 55 | දෙල්ගහවත්ත .. | පොල්ගස් 31ක්ද, පොල්පැල 68ක්ද, කජුපැල 12ක්ද, ආතගස් 6ක්ද, කොච්චන්පැලයක්ද, අඹගස් 7ක්ද, කොස්ගස් 3ක්ද, ගොඩපොරගහක්ද, හල්මිල්ලගහක් සහ දෙවටපාරක කොටසකින්යුත් පොල්ඉඩම | කේ. ඩී. වින්සන්ට් ගුනසේකර අත්තිඩිය | 0 | 2 | 7 |
| 56 | එම .. | පොල්ගස් 91ක්ද, පොල්පැල 37ක්ද, කොස්ගස් 31ක්ද, අඹගස් 4ක්ද, අඹපැල 3ක්ද, පුවක්ගස් 15ක්ද, පුවක් පැල 2ක්ද, ගොරකගස් 2ක්ද, ගොරකපැල 2ක්ද, දෙඩම්ගස් 3ක්ද, නාරන්ගස් 4ක්ද, බිලින්ගස් 4ක්ද, දෙල්පැල 2ක්ද, කජුපැල 2ක්ද, හික්ගස් 2ක්ද, දවට පැල 4ක්ද, වල්ලගහක්ද, තරණගස් 3ක්ද, කැබැල්ල ගහක්ද, ගොඩපොරගස් 8ක්ද, මඞීත්තගස් 3ක්ද, හල් මිල්ලගහකද, කෙසෙල් පඳුරු 9ක්ද, අතුසෙවිලි මැටි ගේපැලක් සහ අතුසෙවිලි මැටි වැසිකිලියකින්යුත් පොල්ඉඩම | කේ. ඩී. ඒ. ගුනසේකර සහ පේරගේ දොන ලෙනෝහාමි, අත්තිඩිය | 0 | 3 | 13·7 |
| 57 | කහටගහවත්ත | පොල්ගස් 17ක්ද, පොල්පැල 86ක්ද, කජුගහක්ද, කොස් පැල 3ක්ද, අඹපැල 7ක්ද, දෙඩම්පැල 5ක්ද, දෙළුම් පැලයක්ද, සපදිල්ලාගහක්ද, කෙසෙල්පඳුරු 17ක්ද, කුරුඳු පඳුරු 40ක් සහ දෙවටපාරක කොටසකින්යුත් පොල්ඉඩම | කුඩාලියනගේ දොන් ලිවිනිස් ගුනසේකර, අත්තිඩිය | 0 | 3 | 32·3 |
| 58 | එම .. | පොල්ගස් 12ක්ද, පොල්පැල 88ක්ද, වෙරළුගහක්ද, කජු ගහක්ද, කොස්ගස් 3ක්ද, කොස්පැල 2ක්ද, අඹපැල 4ක්ද, දෙහිපැල 10ක්ද, දෙඩම්පැල 8ක්ම, උගුරැස්ස පැල 2ක්ද, දෙල්පැල 3ක්ද, පුවක්පැල 13ක්ද, කෙසෙල් පඳුරු 9ක්ද, අතුසෙවිලි මැටි ගේපැලක්ද, ගෙයක් සෑදීමට තනනලද මේසන්වැඩ කරනලද අත්තිවාරමක්ද, මේසන්වැඩකරනලද බිත්තිවලින් සහ අතුසෙවිලි වහලකින්යුත් වැසිකිළියක් සහ ළිඳකින්යුත් පොල්ඉඩම | කුඩාලියනගේ දොන ඇඩලින් ගුනසේකර සහ බබුන විටගමගේ දොන් ජේම්ස් (සම්මුතිව), දෙදෙනාම අත්තිඩිය | 1 | 0 | 6·1 |
| 59 | කහටගහවත්ත | පොල්ගස් 42ක්ද, පොල්පැල 86ක්ද, කොස්ගස් 12ක්ද, අඹපැල 4ක්ද, දෙල්ගස් 2ක්ද, කජුපැල 4ක්ද, දෙහිපැල 11ක්ද, දෙඩම්ගස් 24ක්ද, දෙළුම්පැල 12ක්ද, පුවක්පැල 8ක්ද, ගොරකගස් 2ක්ද, ආතගහක්ද, පැපොල්ගස් 4ක්ද, මුරුන්ගාගස් 3ක්ද, කෙසෙල්පඳුරු 29ක්ද, මේසන්වැඩකරනලද උළුසෙවිලි ගෙයක්ද, මේසන්වැඩකරනලද බිත්ති සහ අතුසෙවිලි වහලකින්යුත් වැසිකිලියක් සහ මේසන්වැඩකරනලද ඒප්‍රන් එකක් ඇති අබිසීනයන් පොම්පයකින් යුත් පොල් ඉඩම | අහන්ගමවිතානගේ හැරිස් අප්පුහාමි සහ කුඩාලියනගේ දොන නැන්සිනා ගුනසේකර (සම්මුතිව), දෙදෙනාම අත්තිඩියේ | 1 | 0 | 7·5 |
| 60 | එම .. | පොල්ගස් 41ක්ද, පොල්පැල 67ක්ද, කොස්ගස් 4ක්ද, කොස්පැලයක්ද, දෙල්ගහක්ද, අඹගහක්ද, අඹපැල 10ක්ද, දෙඩම්ගස් 4ක්ද, පුවක්ගස් 5ක්ද, පුවක්පැල 5කද, ලුනුමිදෙල්ල පැලයක්ද, ගොරකගහක්ද, කජුගස් 2ක්ද, කජුපැල 8ක්ද, මාදන්ගහක්ද, මූහමල්ගහක්ද, දවටගහක්ද, ආතාගස් 4ක්ද, උගුරැස්සපැලයක්ද, මුරුන්ගාගස් 5ක්ද, දෙහිපැල 2ක්ද, හික්ගහක්ද, දෙළුම්පැලයක්ද, පැපොල්ගස් 5ක්ද, කෙසෙල් පඳුරු 21ක්ද, මේසන්වැඩකරනලද උළුසෙවිලි ගෙයක්ද, මේසන්වැඩකරනලද බිත්ති ඇති සින්ක්තහඩු වහලකින්යුත් වැසිකිලියක් සහ මේසන්වැඩකරනලද බැම්මක් ඇති ළිඳකින්යුත් පොල් ඉඩම | සිංඤොට නානායක්කාර පරනවිතානගේ ආර්නර් අබේගුනවර්ධන, අත්තිඩිය; සිංඤොට නානායක්කාර පරනවිතානගේ ඩූලාවතී අබේගුනවර්ධන, සිංඤොට නානායක්කාර පරනවිතානගේ බුබදස අබේගුනවර්ධන, සිංඤොට නානායක්කාර පරනවිතානගේ පත්මානන්ද අබේගුනවර්ධන, සිංඤොට නානායක්කාර පරනවිතානගේ ජේමදස අබේගුනවර්ධන, සිංඤොට නානායක්කාර පරනවිතානගේ චන්ද්‍රාවතී අබේගුනවර්ධන, (කුඩාලියනගේ දොන ජූලියට් ගුනසේකරගේ උරුමක්කාරයෝ) සම්මුතිව) සියල්ලම අත්තිඩියේ | 1 | 0 | 20·9 |

| නො. | ඉඩමේ න.ම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 61 | කදවලවත්ත .. | පොල්ගස් 7ක්ද, අඹපැලයක්ද, කොච්චිපැලයක්ද, කජු පැලයක්ද, අතගහක්ද, රබර්ගස් 3ක් සහ කබුක්ගල් වලවල්වලින්යුත් පොල්ඉඩම | කේ. ඇන්. ඇම්. ඇස්. පී. නාච්චිඅප්පා චෙට්ටියාර්, නො. 241 වැල්ලවීදිය, කොළඹ | 1 0 30·5 |
| 63 | එම .. | පොල්ගස් 22ක්ද, රබර්ගහක්ද, නෙල්ලිගහක්ද, කොස් පැලයක්ද, අතගහක්ද, මේසන්වැඩකරනලද බිත්ති වලින්යුත් සින්ක්තහඩු වහලක් ඇති ගෙයක්ද, මේසන් වැඩකරනලද කානුවක්ද, මැටිබිත්ති අති සින්ක් තහඩු වහලකින්යුත් කුස්සිපේලියක් සහ මේසන්වැඩ කරනලද බැම්මක් ඇති ළිඳකින්යුත් පොල්ඉඩම | එම | .. 0 3 33·8 |
| 64 | එම .. | පොල්ගස් 2ක්ද, පොල්පැල 64ක්ද, කජුගස් 3ක්ද, සියඹලා ගහක් සහ අතගහකින්යුත් පොල් ඉඩම | එම | .. 1 0 16·7 |
| 65 | — .. | මේසන්වැඩකරනලද බෝක්කු 3ක් සහ නොබැඳපුකානු 3කින්යුත් පාරවල් | එම | .. 2 0 37·6 |
| 66 | කදවලවත්ත .. | පොල්ගස් 1,091ක්ද, පොල්පැල 164ක්ද, කොස්පැල 5ක්ද, දෙල්ගහක්ද, පුවක්ගස් 19ක්ද, රටනෙල්ලිපැල 4ක්ද, කෙසෙල්පඳුරු 15ක්ද, යකඩකනු සහ සින්ක්තහඩු වහලකින්යුත් මඩුවක්ද, අතුසෙවිලි වහලකින්යුත් මඩුවක්ද, අතුසෙවිලි මැටි ගේපැල් 6ක් සහ බිත්ති 4කින්යුත් පොල් ඉඩම | එම | .. 24 0 2·2 |
| 67 | එම .. | කුඹුරක් සහ ඇලකින් කොටසක් .. .. | එම | .. 1 1 8·4 |
| 68 | එම .. | පොල්ගස් 43ක් සහ ඇලකින් කොටසක් ඇති පොල් ඉඩම | එම | .. 0 1 2·3 |
| 70 | එම .. | පොල්පැලයක් සහ කෙසෙල් පඳුරු 8කින්යුත් ඔවිට .. | ජේ. ඇල්. කොතලාවල අත්තිඩිය | 0 0 17·7 |
| 71 | එම .. | පොල්පැල 24කින්යුත් පොල් ඉඩම .. .. | ජේ. ඇල්. කොතලාවල අත්තිඩිය | 0 1 4·1 |
| 72 | එම .. | පොල්පැල 8ක්ද, කොච්චිපැලයක්ද, කෙසෙල්පඳුරු 7ක් සහ නොබැඳපු කානුවකින්යුත් පොල් ඉඩම | එම | .. 0 0 37·3 |
| 73 | එම .. | පොල්ගස් 626ක්ද, පොල්පැල 30ක්ද, කොස්ගස් 2ක්ද, කොස්පැල 5ක්ද, අඹගස් 15ක්ද, අඹපැල 38ක්ද, පුවක්ගස් 105ක්ද, දෙඹපැල 11ක්ද, ගුස්බැරිගස් 2ක්ද, රටනෙල්ලිගස් 3ක්ද, රටනෙල්ලිපැල 3ක්ද, කොච්චිපැල 2ක්ද, අතගස් 8ක්ද, දෙහිගස් 2ක්ද, සපදිල්ලා ගහක්ද, කජුගස් 30ක්ද, කජුපැල 8ක්ද, දෙඩන්පැල 19ක්ද, ජම්බුගහක්ද, දෙඩම්ගහක්ද, රඹුටන්පැල 14ක්ද, කෙසෙල් පඳුරු 31ක්ද, මේසන්වැඩකරනලද උළුසෙවිලි වහලක් ඇති ඇක්ෂින්ගේ ලැගුම්ගෙයකින් යුත් (දැනට ජරාවාස) මේසන්වැඩකරනලද පොල්වේලන බිමක්ද, මේසන්වැඩකරනලද උළුසෙවිලි ගෙවල් 2ක්ද, ළිඳක් සහ අතුසෙවිලි මැටි වැසිකිළියකින්යුත් පොල් ඉඩම | එම | .. 9 2 20·3 |

එබැවින් 1904රේ ආඥාපණත් නොම්මර 18හේ 2 වගන්තියෙන් වෙනස්කරනලද ඉහතකී ආඥාපණතේ 12 (2) වගන්තියේ ප්‍රකාර මේ දැන්වීම ප්‍රසිඹකළ දින පටන් 21 දිනක් යනවුතැන ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ජනවාරි මස 7වෙනි දින පෙරවරු 10ගේ කතිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 27වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. හෝල්ම්ස්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වර්‍යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—උගුරැස්සපිටියේ සෝල්යට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර බව අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 237. ගම—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ හාරිස්පත්තු කොඨාශයේ කුළුගම්මනසියපත්තුවේ උගුරැස්සපිටිය.

| නො. | ඉඩමේ නම. | අනුම. | අයිතිකාරකියන්නා. | මහන, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 1 | මුහන්දිරමලාගේ වත්ත | පොල්ගස් 8ක්, පුවක්ගස 7ක්, කොකවාගහක්, මේසන් වැඩෙන්කළ ස්ථිර සෝල් ගොඩනැගිල්ලක්, ගුරුවරයින්ගේ පදිංචියට තාවකාලික ගොඩනැගිල්ලක්, කුස්සියක් සහ කක්කුස්සියක් තිබෙන වත්ත | උගුරැස්සපිටියේ ඒ. ඇම්. මීරා සයිබු | 0 0 37·8 |
| 2 | එම .. | වත්ත (මැමිල්ලක් නැත) .. .. | එම | .. 0 0 32·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ජනවාරි මස 7වෙනි දින පස්වරු 2කේ කතිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල්ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 27වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

සී. සී. ආර්. ගුනවර්ධන,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාර්‍යයුත්තකට, එනම්:— පනික්කන්කුලමේ ලිඳක් හෑරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" යනුවෙනි ආණ්ඩුවේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. 843. ගම—පනික්කන්කුලම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | හිමිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 19A1 | තිස්ගහවත්ත .. | වත්ත, අවුරුදු 5ක් පමණ වයසඇති පොල්ගසක්ද, අවුරුදු දෙකක් පමණ වයසඇති දෙහිගස් දෙකක්ද, මුරුංගාගසක්ද, කෙහෙල්පඳුරක් සහ අළුතෙන් බඳිනලද ලිඳ ඇතුළුව තාවකාලික පොල්අතු සෙවිලිකරනලද කඩයක කොටසකුත් ඇතුලත් වේ | කලාගම් පලාතේ කැකිරාවේ බී. තෙන්නකෝන් රාළේ මහත්මයා | 0 0 2·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1935ක්වූ ජනවාරි මස 15වෙනි දින පෙරවරු 10යේ කැතිසමට කැකිරාවේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 23වෙනි දින
අනුරාධපුරේ කච්චේරියේදීය.

ඇල්. ඇල්. හන්ටර්,
උ. ම. දි. වැ. බ. ආණ්ඩුවේ ඒජන්තතුමා වෙනුව.

---

## මැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 877

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුවේ ඉඩම් වර්ෂ 1935ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකට බදුදීමට ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මෙම මුද්‍රකරණලද ඉල්ලුම්පත්‍ර වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 12වෙනි බදාදා දවල් 11වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑ බවට ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලු දෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

### කොන්දේසි.

1. බදුමිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගසක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටත් අවසර නැත.

3. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ට වත් නැවත බදුදෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.

4. බදුකාරයා විසින් නාගරික සභාවේ සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

5. බදුකාරයාට මාසයකට කලින් දැනුම්දී වන්දියක් නැතුව නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

6. මිලට ගත් අය විසින් ඉඩම පිරිසිදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ නාගරික සභාවේ අණපනත්වලට යටත්ව ක්‍රියාකළ යුතුයි.

7. ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත පරිදි වුවමනා පමණ බඩු පටවන බාන ස්ථාන බදු ගැනුම්කාරයාට අලාබයක් නොගෙවා පිහිටවීමට බලය තබාගන්නවා ඇත.

8. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් අවසරයක් නැතුව කිසිම ගොඩනැගිල්ලක් සාදන්ට බැරිය. ඉවුරට වන හානිය බදු ගැනුම්කාරයාගේ වියදමෙන් සාදවාදෙන්ට ඕනෑය.

9. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් භාරගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

10. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට හෝ ඉල්ලුම්පත්‍ර නොඉල්ලුවාවෙන් සලකා බද්ද දීමටද ඒජන්ත උන්නාන්සේට බලය තබාගන්ට යෙදුනා ඇත.

### මෙහි සඳහන් ඉඩම.

කිරිලපොනේ පාලමට දකුණෙන් එම ඇළේ බස්නාහිර ඉවුරේ පිහිටි අඩි 50×75 ප්‍රමාණ ඇලට වෙන්කර තිබෙන බිම්කට්ටියේ කොටස බඩු පැටවීමට සහ බෑමට පාවිච්චිකිරීමට වේ.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 30වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

## දැන්වීමයි.

### කෑගල්ලේ පොලිස් උසාවියේ නොම්මර 19,966 දරණ නඩුවේ තහනමට ගත් දේපල විකිණීමේ නොතිසියයි.

මෙහි පහත දක්වන දේපලවලින් ඉහතකී නඩුව සම්බන්ධ සැලකී සිටින විත්තිකාරයාවන, අටාලෙ පදිංචි බැද්දේවිදානෙලාගේ පොඩිනයිදෙට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1935ක්වූ ජනවාරි මස 8වෙනි දින අඟහරුවාදා පෙරවරු 9යේ පැයට එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ, එනම් :—

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලයට අයත් අඹෙප වසමේ, අටාල සහ ගම පිහිටා තිබෙන වී දෙපෑලක වපසරිය ඇති නුගමුලවත්තට මායිම්—උතුරට පුංචිකිරාගේ වත්තෙත් මායිමද; නැගෙනහිරට උනපඳුරේගෙනවත්තද; යන මායිම්තුල පිහිටි ඉඩමෙන් නොබෙදුනු $\frac{1}{36}$ ක් පංගුවක්ද.

2. එම ගම පිහිටා තිබෙන වී කුරිනි අටක වපසරිය ඇති ගලගාවවත්තට මායිම්—උතුරට යිරුගලගෙනවත්තෙ මායිමද; නැගෙණහිරට ගලගාවවත්තෙත් වැටියද; දකුණට ගලගාවකුඹුරද; බස්නාහිරට පම්පියෙවත්තද යන මායිම් තුල පිහිටි ඉඩමෙන් නොබෙදුනු $\frac{1}{18}$ පංගුවක්ද.

3. එමගම පිහිටා තිබෙන වී පෑලක සහ කුරිණි හයක වපසරිය ඇති දුම්මාලගෙනට මායිම්—උතුරට අස්වැද්දුමෙ කුඹුරද; නැගෙණහිරට පරනවත්තද; දකුණට තිත්ගහ මූලගේනද; බස්නාහිරට වෙරලුගොල්ලෙවත්තද යන මායිම් තුල පිහිටි කුඹුරෙන් $\frac{1}{36}$ පංගුවත්ය.

ඇෆ්. සී. ජීම්සන්,
උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 12 වෙනි
දින කෑගල්ලේ කච්චේරියේදීය.

**රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.**

**හලාවත දිස්ත්‍රික්කයේ හුන්දිරපොල නම් ග්‍රාමයේ රා සහ අරක්කු තැබෑරුම් විවෘතකිරීම පිණිස ජන්දය විමසීම.**

අංක 7,478 සහ වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 14වෙනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකළ අංක 146 දරන සුරාබද්ධ සම්බන්ධ දැන්වීමේ 6වෙනි වගන්තිය (අංක 180, 187, 194, 202, 221, 222 සහ 225 දරන මත්පැන් සම්බන්ධ දැන්වීම්වලින් වෙනස්කළ පරිදි) යටතේ නියමවූ බලය ප්‍රකාර වයඹ පළාතේ පුත්තලම් සහ හලාවත දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් පහත සඳහන් තැබෑරුම් සඳහා වෙන්කරනලද කොට්ඨාසවල ජන්දදායකයින්ගේ අන්තිම ලැයිස්තුවේ නම් පෙනෙණන අයවළුන්ගෙන් සියේට 60ක් තැබෑරුම් විවෘතකිරීම සඳහා අවසරපත්‍ර දීම ගැන සතුටුද යන්න දැනගැනීම සඳහා ජන්දය විමසීම පිණිස පහත සඳහන් දිනය සහ ස්ථානය නියමකර තිබෙන බව මෙයින් දන්වනු ලැබේ.

(ජන්දය විමසන වේලාව:—පෙරවරු 8 සිට 12 දක්වා සහ පස්වරු 1 සිට 6 දක්වා.)

| තැබෑරුම. | ජන්දය විමසන දිනය. | විමසන ස්ථානය. | කොට්ඨාශය. |
|---|---|---|---|
| හුන්දිරපොල අරක්කු තැබෑරුම සහ රා තැබෑරුම | වර්ෂ 1935 ජනවාරි මස 19වෙනි සෙනසුරාදින | පොතුවටවන ආණ්ඩුවේ පාඨශාලාව | හුන්දිරපොල, පොතුවටවන, කහටවිල, කලියවඩන, තුලාවෙල, යක්දෙස්සාව, මීගහවෙල සහ කුද්දෙඩියාව |

2. ජන්දය විමසීම සඳහා එකම දිනය සහ වේලාව සඳහන් නමුත් එම අවසරපත්‍ර දෙක සඳහා වෙන වෙනම කැමැත්ත ගනු ලැබේ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 21වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

ඒ. ඊ. ක්‍රිස්තෝපල්ස්,
පුත්තලම් සහ හලාවත දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උප දිසාපතිතුමා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.